පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව- සතිපාසල

සතිය - 6

විෂය:- නර්තනය

ශ්‍රේණිය :- 11

Prepared by - කලාප අධ්‍යාපන කාර්යාලය, කෑගල්ල

# . සිංහල හා දෙමළ ගැමි නැටුම් පිළිබඳ සංස්කෘතික පසුබිම

ඕනෑම සංස්කෘතියක සිය අනන්‍යතාව ප්‍රදර්ශනය කෙරෙනුයේ එකී සංස්කෘතිය තුල පවතින විවිධ කලාංග වලිනි.මේ අතරින් ගැමි නැටුම් සුවිශේෂි වේ. ගැමි ජනතාවගේ ජීවන වෘත්තීන් ,සිතුම් පැතුම්,ඇදහිලි, විශ්වාස,ආගමික පසුබිම,විනෝදාස්වාද,ඇදුම් පැළදුම් ගැමි නැටුම් මගින් විදහා දැක්වේ.බහුවිධ සංස්කෘතියක අනන්‍යතා ලක්ෂණ ,එහි සමාන අසමානතා හා එහි සුවිශේෂිතා හඳුනාගත හැකි එක් කලාංගයක් වනුයේ ගැමි නැටුම් බව කිව යුතුය.

දේශීය සිංහල ජනතාවගේ ගැමි නැටුම් හා හින්දු ආගම හා බැඳී දෙමළ සංස්කෘතිය තුළ දක්නට ඇති ද්‍රවිඩ ගැමි නැටුම් තුළත් ඉහත කී ලක්ෂණ හඳුනා ගත හැකිය. දකුණු ඉන්දියානු සංස්කෘතික ලක්ෂණයන් ට සමීප බවක් පෙන්වන ද්‍රවිඩ ජන නැටුම් හා සිංහල ගැමි නැටුම් අතර සමානතා ඇති ගැමි නැටුම් රැසක් වෙයි.

උදා- සිංහල / දෙමළ

| සිංහල | දෙමළ |
|---|---|
| කළගෙඩි | සෙම්බු/චෙම්බු |
| ලී කෙළි | කෝලාට්ටම් |
| ලී මල්ලිය | පින්නල් කෝලාට්ටම් |
| ගොයම් නැටුම | අරුවිවෙට්ටු |
| කුලු | සුලකු |
| | කාවඩි |

කුම්මි වශයෙන් සමානතා ඇති ගැමි නැටුම් දක්නට ඇත.

__කළ ගෙඩි හා චෙම්බු__





සිංහල ජන ජීවිතය තුල කළගෙඩි නැටුමෙන් පිළිබිඹු වන්නේ කාන්තා ලාලිත්වයයි.ලඳුන් මැටි නළය උකුලේ තබාගෙන ඒම,දිය නෑම,ජල ක්‍රීඩාවේ යෙදීම වැනි අවස්ථා නර්තනයට එක් කරගනිමින් කළගෙඩි නර්තනයේ යෙදීමඅපූර්ව ලෙස නිර්මාණයට ලක් කර ඇත.එසේම රවුම් හැඩයක් ගත් මැටි කළය සිංහල සංස්කෘතියට අනන්‍ය වූවකි.

එහෙත් දෙමළ කාන්තාවන් සෙම්බු වලට දිය පුරවා හිස මත තබාගෙන යෑම සිරිතයි. නර්තනයේදී සෙම්බුව අතින් ගන්නා කාන්තාවෝ ඒවා අතිනතට මාරු කරගනිමින් උඩ දමා අල්ලමින් විවිධ හැඩ මතුවන සේ අතෙහි තබා ගනිමින් පසුබිම් සංගීතයට අනුව ලාස්‍ය ලක්ෂණයෙන් යුතු චලන ඉදිරිපත් කෙරේ.පිත්තලින් නිම කල කළ භාවිතාය ඔවුන්ට අනන්‍ය වූවකි.

විශේෂයෙන් කළගෙඩි හා සෙම්බු නර්තනය සමාන ලක්ෂණ පෙන්නුම් කරයි. විශේෂයෙන් නර්තන මගින් ඉදිරිපත් කරන චලන සිය අනන්‍යතා ලක්ෂණ පිළිබිඹු කරයි. විනෝදය අරමුණු කරගනිමින් රචනාවීම සංස්කෘතීන් දෙකෙහිම සමානයකි.එහෙත් රංග වස්ත්‍රාභරණයන්හි සුවිශේෂිතා දක්නට ලැබේ. සිංහල කාන්තාවන් රෙදි හැට්ටවලින් සැරසී නර්තනය බදිරිපත් කරන අතර දෙමළ ලඳුන් සාරියෙන් හෝ හැට්ටයකින් සැරසී වරලසෙහි මල් ගසා නර්තනය කරයි.ගායනය හා වාදනය තමාට සුවිශේෂි ලෙස යොදාගෙන තිබීම දක්නට ලැබේ.

<u>ලී කෙළි හා කෝලාට්ටම්</u>





ලී කෙළි නැටුම සඳහා කිතුල් කරඳ වනි අඩියක් පමණ දිග ඇති එකසමාන ලී පොලු දෙකක් යොදා ගැනේ.එහිදී යුගල වශයෙන් නැටුම සිරිතයි.ලී එනිනෙක තට්ටුකර ගනිමින් ජව සම්පන්න ලෙස නර්තනය මෙහිදී දක්නට ලැබේ.එසේම සරල වාදනයත් සමග ගීත ගායනය ලී ගැසීමත් කෝලාට්ටම් වල සිදුවන්නකි. ද්‍රවිඩ සංස්කෘතිය තුල සුවිශේෂි ගෙතීම් රටා දැකිය හැකිය. මෙම ගෙතීම් නැවත ලිහමින් අලංකාර රටා සහිතව ශිල්පීය කුසලතා ප්‍රදර්ශනය කරමින් පින්නල් කෝලාට්ටම් ඉදිරිපත් කරයි. ගැමි පරිසරයක එළිමහනේ ගස්වල ගැට ගැසූ රෙදි හෝ ලණු හෝ භාවිත කරමින් පින්නල් කෝලාට්ටම් නැටීම සිරිතයි. ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයම මෙම නර්තනයේ යෙදෙයි. රග මඩල මැද තබන ලද ලී කනුවෙහි ගැට ගසා ඇති ලණු අල්ලා ගන්නා නළු නිළියන් විවිධ හැඩ අනුව ලණු අතරින් රිංගමින් එකිනෙකා ප්‍රතිවිරුද්ධව ගමන් කරති. ඉන් ඉතා අලංකාර රටා නිර්මාණ ගම්‍යමාන වේ.

මෙයට සමානව දේශීය වශයෙන් ලී මල්ලිය භාවිතය ලී කෙළි නැටුමේදි දක්නට ලැබේ. මෙහිදිද රංග රටා ගෙතීම හා ලී මල්ලියේ (දගයේ) ගෙතීම යනුවෙන් ව්‍යවහාරයේ පවතී.මෙසේ සිංහල හා දෙමළ ගැමි නැටුම් විවිධ අවස්ථා වලදි දැක ගත හැකි වේ . පෙරහැර,ප්‍රසංග වේදිකාව, ජන මාධ්‍ය ,මේ අතර සුවිශේෂි වේ. සමාජ,ආගමික,ජාතික හා අන්තර්ජාතික උත්සව වලදී මෙම ගැමි නැටුම් දැක ගත හැකිවේ.සතුට,විනෝදය,ආගමික අවශ්‍යතා මූලික කොටගනිමින් ගැමියා නිර්මාණය කල ගැමි නැටුම් වලින් සාමූහිකත්වය,සරල බව,උපකරණ භාවිතය හා එමකම ප්‍රදර්ශනය වේ.

කාර්‍ය පත්‍රිකාව

1) නාමිකව සමානකම් ඇති සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් පහක් නම් කරන්න.
2) සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් වල ඔබ දකින සමාන හා අසමානතා පිළිබඳ විස්තර කරන්න .
3) සිංහල හා ද්‍රවිඩ ගැමි නැටුම් භාවිතා වන අවස්ථා නම් කරන්න.
4) සංස්කෘතින් දෙකෙහිම දක්නට ඇති ගැමි නැටුම් වල ලක්ෂණ හතරක් ලියන්න .